# ආරම්භක නව යොවුන් වියේ පාසල් සිසුන්ගේ ශාරීරික හා අධ්‍යාපනික ප්‍රශ්න තුළින් පැනනැගෙන සිත් කරදර පිළිබඳ ව ශ්‍රී ලංකාවේ එක් අධ්‍යාපන මණ්ඩලයක් ඇසුරින් කරන අධ්‍යයනයක්

දර්ශනපති (අධ්‍යාපන) උපාධි පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන
පර්යේෂණ නිබන්ධනය
1982 ජනවාරි

UCLIB
379841

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
කොළඹ 03.

සීතා සඳසීලි සමරසිංහ,
ශාස්ත්‍රවේදී සාමාන්‍ය,
අධ්‍යාපන ඩිප්ලෝමා,
අධ්‍යාපනපති.

සංක්ෂේපයෙන් ......

පෞරාණික සමාජයෙහි ඉතා කෙටි කලකට සීමා වූ නව යොවුන් විය, එම අවධියේ සිසුන්ට එතරම් දුෂ්කරතාවයක් නොවූ නමුදු අද තත්ත්වය ඊට හාත්පසින් ම වෙනස් ස්වරූපයක් ගන්නා බව විද්‍යමාන වේ. වත්මන් සමාජයෙහි යෞවනය ඉතා දිගු කලක් තුළ ව්‍යාප්ත වන අතර, විශේෂයෙන් ම ආරම්භක යොවුන් විය කරදරකාරී සමයක් ව ඇත.

යෞවනෝදයෙන් ආරම්භ වන-එසේ ම දළ වශයෙන් අවුරුදු 17 පමණ තෙක් දිවෙන-ආරම්භක යොවුන් සමය තුළ දී, ශිෂ්‍යයා කායික, ලිංගික, චිත්ත වේගික, මානසික හා සාමාජයික වශයෙන් සීඝ්‍ර විපර්යාසයකට මුහුණපාන හෙයින්, මේ අවධිය වඩාත් ගැටලු සහගත වන බව පැවසිය හැකිය. මෙවැනි කායික විපර්යාසයන් තුළ ජීවත්වන සිසුගේ අසහනකාරිත්වයන් පාසැල විසින් විසඳනවා වෙනුවට, අධ්‍යාපනික කරදර ද එකතු වීමෙන් අති දුෂ්කර වකවානුවක් බවට පෙරළීමක් සිදුවන බව සඳහන් කළ යුතු වේ. අධ්‍යාපනික තරඟකාරිත්වයෙන් මිරිකෙන සිසුට, ජාතික මට්ටමින් ඔහුගේ ස්ථානය තීරණය වන අ.පො.ස. විභාගය සඳහා ගුරුතර වැඩිහිටියන් එල්ල කරන පීඩනයන් ද එකතු වී මෙම සිත් කරදර තව තවත් වර්ධනය කෙරේ.

මෙම පසුතලය මත රඳමින් මෙහෙයවන ලද පර්යේෂණයෙන් මා ප්‍රයත්න දරා ඇත්තේ, මුල් යොවුන් වියේ සිසුන්ගේ විවිධ සිත් කරදර අතුරින් ශාරීරික හා අධ්‍යාපනික ප්‍රශ්න තුළින් පැනනැගෙන චෛතසික කරදරකාරී තත්ත්වයන් පිළිබඳ ව ගවේෂණයක් කිරීමටය. මෙබඳු අධ්‍යයන අප රට විරල ව පැවතීම කාලානුරූප නොවන බව ද සඳහන් කළ යුතු වේ.

සිසුගේ පූර්ණ සංවර්ධනය සඳහා පාසැලෙන් ඉටු විය යුත්තේ වැදගත් කාර්ය සම්භාරයකි. පාසැලේ වැඩ මාලාව අධ්‍යාපනයට පමණක් සීමා නොවිය යුතු අතර, ඔහුගේ චිත්ත වේගීය ජීවිතය කෙරෙහි ද නිසි සැලකිල්ල යොමු විය යුතු බවයි, මින්

අවධාරණය කරනු ලබන්නේ. මේ අනුව ජීවිතයේ තීරණාත්මක අවධියක සිසුන් පෙළෙන සිත් කරදර හෙළි කරලීමෙන්, ඒ කෙරෙහි ගුරුවර වැඩිහිටි සහ වගකීව යුත්තන්ගේ නිසි අවධානය යොමුකර වීමට වෑයම් දැරීම මාගේ පරමාර්ථය විය. සිසුන්ගේ සිත් කරදර විදහාපාන අතීත අධ්‍යයන කිහිපයක් ද අප විසින් ඉදිරිපත් කර ඇත.

නව යොවුන් සංකල්පය මනාව ප්‍රතිෂ්ඨාපිත හා අධ්‍යාපනික අධි තරඟකාරිත්වයෙන් යුක්ත අධ්‍යාපන මණ්ඩල අතුරින් මාතර මණ්ඩලය, මගේ පර්යේෂණ කාර්යය සඳහා තෝරා ගතිමි. මෙහි දී ස්ත්‍රී පුරුෂ හා ප්‍රාදේශීය වශයෙන් වූ සිත් කරදරයන්හි ප්‍රභේදතා සොයා බැලීම සඳහා, පාසැල් ස්ථර හතරකට බෙදන ලදී. අනතුරු ව අහඹු ක්‍රමය යටතේ තෝරා ගන්නා ලද, සිසු පෙතුරු 42 ක සිසුන් 1225 ක් අධ්‍යයන කාර්යය සඳහා යොමු කෙරිණි. මින් 610 ක් ශිෂ්‍යයන් වන අතර ශිෂ්‍යාවෝ 612 ක් වූහ.

පර්යේෂණ සැලැස්ම ක්‍රියාත්මක කරන ලද්දේ රොස් එල්. මූනිගේ ගැටළු ලැයිස්තුවේ සැලැස්ම අනුව ගොඩනගන ලද ප්‍රශ්නාවලී ක්‍රම ශිල්පය මත සැකසුණු සිත් කරදර නාමාවලියක් මගිනි. එය ගැටළු ක්ෂෙත්‍ර 16 කට බෙදා වෙන්කර ඇත.

එහි වලංගුතාවය ආරක්ෂා කිරීමේ අභිප්‍රායයෙන් උපකාරක පරීක්ෂණයක්, පූර්ව පරීක්ෂණයක් හා නියැදියේ 10% කින් සම්මුඛ සාකච්ඡාවක් ද, තවත් ක්‍රම කිහිපයක් ද උපයෝගී කර ගන්නා ලදී. මෙහි දී ගැටළු ක්ෂෙත්‍ර 16 යටතේ නියැදියේ විචල්‍යයන් දෙකක් බැගින් සසඳමින් අභ්‍යුපගමය 62 ක් පරීක්ෂාවට ලක් කරන ලදී.

ප්‍රතිඵල විශ්ලේෂණයේ දී, එක් එක් ගැටළු ක්ෂෙත්‍රයක විවිධ පරීක්ෂණාංගයනට ලද ශිෂ්‍ය ප්‍රතිචාර, පාසැල් ස්ථර යටතේ ප්‍රතිශතක සංඛ්‍යාවන් මගින් පැහැදිලි කර ඇත. එහි මධ්‍යයනයන් ඇසුරින් නාගරික ගැහැණු පාසැල්, නාගරික පිරිමි පාසැල්, නගරබද - ගම්බද, මිශ්‍ර - අමිශ්‍ර, මුළු පිරිමි - මුළු ගැහැණු යන විචල්‍යයන්හි මධ්‍යයනයන් සොයා ගෙන, ජොසප් සුබින්ගේ විධි රේඛයට අනුව වෙසෙසියා මට්ටම් ගණනය කොට විචල්‍යයන්

දෙකක් බැගින් සසඳනු ලැබීය. මේ අනුව අභ්‍යුපනාස 26 ක් 10% යේ මට්ටමින් ප්‍රතික්ෂෙප නොවීය. අභ්‍යුපනාස 36 ක් 10%, 5%, 1%, 0.1% යන වෙශසයි මට්ටම් අනුව ප්‍රතික්ෂේප විය.

අනතුරු ව ප්‍රතිඵල පිළිබඳ අර්ථ කථනයක් සිදු කරන අතර ඒ ඇසුරින් නිගමන හා යෝජනා ඉදිරිපත් කෙරේ. අධ්‍යයනයේ ප්‍රතිඵල අනුව සිසුන් සිත් කරදර සමුදායයෙකින් වෙළී ඇති බව අනාවරණය විය.